# 12. දෙව් පියා සතුටු කරමු (2)

විසිරී ඇති පොත්පත් ටික
එක්කර අහුරා තැබුවා
නිවස අපේ අතුගාලා
සැම තැන ලස්සන කෙරුවා

පාසල වෙත පිය නැඟුවා
පන්තිය පිරිසිදු කෙරුවා
සැම දෙනා ම එකතු වෙලා
පන්තිය ලස්සන කෙරුවා



මිදුල පුරා ඇති කුණු රොඩු
එක්කර වළකට දැමුවා
වල් පැළ ටික ගලවාලා
මිදුල අපේ හැඩ කෙරුවා





පරවුණු මල් අස් කෙරුවා
දෙවිඳු මැදුර හැඩ කෙරුවා
සැම තැන ලස්සන කෙරුවා
දෙවි පියාව තුටු කෙරුවා

**දෙවි පියා දුන් නිවෙස පාසල සහ දෙවි මැඳුර පිරිසිදු ව තබා ගනිමු.**

## පැවරුම්

1. ඔබගේ නිවස, පන්තිය, දෙවි මැදුර ලස්සනට තබා ගැනීමට කළ හැකි දේවල් තුන බැගින් ලියන්න.
2. ඉවත දමන කුණු රොඩු නියමිත තැන්වල දැමීමට පුරුදු වන්න.